**13 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 3 වන සතිය - මැයි 18 සිට 22 දක්වා**

**විදේශ වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දක්වමින් ඒවායේ වෙනස්වීම්වලට හේතු හා ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම**

- අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස හැඳින්වේ.
- වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දෙකකි.
  1.භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය
  2.ආදායම් වෙළෙඳ අනුපාතිකය

- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ලෙසින් අර්ථ දක්වන්නේද අපනයන ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය ලෙස දැක්වූ වෙළෙඳ අනුපාතයමය.

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතය} = \frac{\text{අපනයන මිළ දර්ශකය}}{\text{ආනයන මිළ දර්ශකය}} * 100$$

1. 2019 වර්ෂයේ අපනයන මිළ දර්ශකය = 103.5
   2019 වර්ෂයේ ආනයන මිළ දර්ශකය = 108.4
   භාණ්ඩ වෙළෙඳ අනුපාතය ගණනය කරන්න.

2. භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු 4ක් ලියන්න.
3. භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වැඩි වීම කෙරෙහි බලපාන හේතු 4ක් ලියන්න.

(මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ඇසුරෙන් භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වී ඇති ආකාරය පිළිබඳව සොයා බලන්න.)